ET/SSS/2022(2023)/OL/87/S/Q/S-4

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

# ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Communication and Media Studies

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය




**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

Nenasa

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
# Ministry of Education, Sri Lanka

| 87 | S | I |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I,II**
தொடர்பாடலும் ஊடகக் கல்வியும் I,II
**Communication and Media Studies I,II**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.**
ɥbďȳஞ̄ɛɟỢɠ ɥɐɕ 10 -ɐஜ்ஞ் Ō
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

## සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40ක් හිමි වේ.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

1. එක් අයෙකු කේන්ද්‍ර කොටගෙන වැඩිදෙනෙක් වෙත පණිවිඩය පැතිර යන විධිමත් සන්නිවේදන ආකෘතිය කුමක්ද?
   (1) චක්‍රීය ආකෘතිය (2) දාම ආකෘතිය
   (3) වයි (Y) ආකෘතිය (4) රෝද ආකෘතිය

2. පරිගණකය ආධාරයෙන් තොරව පන්ති කාමරය තුළ දී භාවිතයට ගත හැකි ප්‍රක්ෂේපණීය මාධ්‍ය උපකරණයක් වන්නේ,
   (1) අන්තර් ක්‍රියාකාරී පුවරුව යි. (2) බහුමාධ්‍ය ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.
   (3) පිටු පෙරලනය යි. (4) ක්ෂණික ප්‍රක්ෂේපණ යන්ත්‍රය යි.

3. තොරතුරු තාක්ෂණයේ වර්ධනයත් සමග සියලු මාධ්‍ය එක් ව පරිහරණය කිරීමේ හැකියාව ලැබී ඇත. මෙය හඳුන්වන්නේ,
   (1) මාධ්‍ය අභිසාරීතාව ලෙස ය. (2) අන්තර්ජාල සන්නිවේදනය ලෙස ය.
   (3) අධිපාඨනීයත්වය ලෙස ය. (4) මාධ්‍ය අංකිතකරණය ලෙස ය.

4. රෙදිපිළි අලෙවි සැලකට පැමිණි අයෙක් රෙදි සොරකම් කර තම බෑගයේ දමා රැගෙන යන බව දැන ගැනීමට වඩා යෝග්‍ය උපක්‍රමයක් වන්නේ,
   (1) සංවෘත පරිපථ රූපවාහිනී කැමරාව භාවිතය යි.(2) විද්‍යුත් කැඳවනයක් භාවිත කිරීම යි.
   (3) මුර සේවකයෙකු යොදා ගැනීම යි. (4) විද්‍යුත් පිරික්සුම් උපකරණ භාවිත කිරීම යි.

5. විමල් අල්විස් ගවේෂණශීලී පුවත් වාර්තාකරුවෙකි. තොරතුරු රැස්කරන්නෙකු ලෙස ඔහු සතු ලක්ෂණ වීමට **අවම ඉඩක්** ඇත්තේ,
   (1) උපායශීලී වීම හා අපක්ෂපාති වීම. (2) ඉවසීම හා හොඳ නිරීක්ෂකයෙකු වීම
   (3) පුවත් ඉව හා කූඨ උපක්‍රමශීලියෙකු වීම (4) තොරතුරු මූලාශ්‍ර පිළිබඳ දැනුම හා විචක්ෂණශීලී වීම

6. යම් සිදුවීමක් නිරීක්ෂණය කර එය තවත් අයෙකුට සන්නිවේදනය කිරීම හැඳින්විය හැකි වන්නේ,
   (1) ප්‍රවෘත්තියක් යනුවෙනි. (2) වාර්තාවක් යනුවෙනි.
   (3) තොරතුරක් යනුවෙනි. (4) ආරංචියක් යනුවෙනි.

7. සමූහ සන්නිවේදනය පිළිබඳ **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
   (1) බොහෝ දුරට ඒක පාර්ශවීය සන්නිවේදනයකි.
   (2) සමූහයේ සිටින්නේ දන්නා අය පමණි.
   (3) සමූහය කුඩා හෝ විශාල විය හැකිය.
   (4) ඉදිරියේ සිටින තැනැත්තන් සමග කෙරෙන සන්නිවේදනයකි.

8. කැමරාවක අනිවාර්යයෙන් පිහිටා තිබෙන කොටස් 3කි,
   (1) මතක කාඩ්පත, කාච විවරය, ද්වාරය
   (2) කැමරා කාචය, ද්වාරය, කාච විවරය
   (3) ක්ෂණික ආලෝක සම්බන්ධතාව, කැමරා කාචය, ද්වාරය
   (4) ක්ෂණික ආලෝක සම්බන්ධතාවය, මතක කාඩ්පත, කාච විවරය

9. "අවබෝධයෙන් රූපවාහිනිය පරිශීලනය කරමු." යන්නෙහි අදහස වන්නේ,
   (1) රූපවාහිනී සියලු සන්දේශ පිළිබඳ විශ්වාසයක් ඇති කර ගැනීම යි.
   (2) විවිධ සමාජීය අවශ්‍යතා සඳහා නිරන්තරයෙන් පරිහරණය කිරීම යි.
   (3) තම අවශ්‍යතාවලට අනුව ගුණාත්මක හා හරවත් වැඩසටහන් තෝරාගෙන නැරඹීම යි.
   (4) රූපවාහිනී වැඩසටහන්වල ඇති වික්‍රමාන්විත සිද්ධි චරිත හෝ අත්දැකීම් අනුකරණය කිරීම යි.

10. අන්තර් පුද්ගල සන්නිවේදනයට අයත් **නොවන** අවස්ථාවක් වන්නේ,
   (1) නංගී ගීතයක් ගයමින් බෝනික්කා නැලවීම
   (2) බස් රථයේ දී මිතුරියක් හමු වී කතාබහේ යෙදීම
   (3) මුළුතැන්ගෙය තුළ මව සහ පියා කතාබහ කරමින් සිටීම
   (4) සිසුවා ගුරුතුමිය සමග ගැටලුවක් සාකච්ඡා කිරීම

11. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව යනු,
   (1) සමාගමක් ලෙස ස්ථාපිත කරන ලද්දකි.
   (2) සීමාසහිත සමාගමක් ලෙස ආරම්භ වූවකි.
   (3) පාර්ලිමේන්තු පනතකින් සමාගමක් ලෙස ආරම්භ වූවකි.
   (4) පාර්ලිමේන්තු පනතකින් සංස්ථාවක් ලෙස ස්ථාපිත කරන ලද්දකි.

12. ප්‍රබල ජනමාධ්‍ය පිළිබඳ ව ශලනි, කමනි හා තමරා කතා බහක නියැලේ.
   **ශලනි** - මම කැමති ජංගමශීලී, අවම වියදම් සහිත, පරිකල්පනීය මාධ්‍යයකට
   **කමනි** - මම කැමති ක්ෂණිකව සම්බන්ධ විය හැකි, භූගෝලීය බාධක අඩු, අවම වියදම් සහිත මාධ්‍යයකට
   **තමරා** - මම කැමති සමීප, සජීවී, අස්ථායී මාධ්‍යයකට
ඉහත කතාබහට අනුව ගුවන්විදුලියට කැමති මේ අතරින් කවුරුන් ද?
   (1) කමනි පමණි. (2) ශලනි සහ කමනි ය.
   (3) තමරා සහ කමනි ය. (4) ශලනි පමණි.

13. අන්තර් ක්‍රියාකාරී පුවරුවක සුවිශේෂතාව වන්නේ,

(1) කුඩා පෙට්ටියක් ලෙස පැවතීම

(2) විනිවිදක රූප රාමු යොදාගත හැකිවීම

(3) පුවරුව මතුපිට කාන්දම් ස්වභාවයක් පැවතීම

(4) පුවරුව ඇඟිල්ලෙන් ස්පර්ශ කිරීමෙන් ක්‍රියාත්මක කළ හැකිවීම

14. ජන සන්නිවේදන ක්‍රියාදාමය ශීඝ්‍ර දියුණුවකට පත් වූ හේතුව දක්වෙන වඩාත් ගැලපෙන පිළිතුර වන්නේ,

(1) ප්‍රවාහන ක්ෂේත්‍ර දියුණුව ය. (2) ආර්ථිකයේ ශීඝ්‍ර දියුණුව ය.

(3) ජනතා අවශ්‍යතා වර්ධනය වීම ය. (4) සන්නිවේදන තාක්ෂණය වර්ධනය වීම ය.

15. කැමරාවක ක්‍රියාකාරීත්වය සම්බන්ධව පහත කරුණු අතරින් වඩාත් නිවැරදි කරුණ වන්නේ,

(1) කාච විවරය විශාල වන විට ක්ෂේත්‍ර ගැඹුර වැඩි වේ.

(2) කාචයේ නාභි දුර වැඩිවන විට ක්ෂේත්‍ර ගැඹුර වැඩි වේ.

(3) කැමරාවේ සිට වස්තුවට ඇති දුර අඩු වන විට ක්ෂේත්‍ර ගැඹුර අඩු වේ.

(4) කැමරාවේ සිට වස්තුවට ඇති දුර අඩු වන විට ක්ෂේත්‍ර ගැඹුර වැඩි වේ.

16. ''දනිඳුට විශේෂාංග රචනාකරණය සඳහා හොඳ හැකියාවක් ඇතැයි ප්‍රධාන කර්තෘවරයා නිතර පවසයි.'' ඔහුට විශේෂාංග රචනය සඳහා භාවිත කළ හැකි වඩාත්ම සුදුසු ක්‍රමවේදය,

(1) යටිකුරු පිරමීඩ ආකෘතිය යි. (2) උඩුකුරු පිරමීඩ ආකෘතිය යි.

(3) ඍජු වාර්තාකරණය යි. (4) W5 සහ H ප්‍රශ්න යි.

17. මාධ්‍ය මඟින් එල්ලවන අයහපත් බලපෑමක් **නොවන්නේ,**

(1) අවර ගණයේ රසවින්දනයට හුරු වීම. (2) සාම්ප්‍රදායික භාෂාව වෙනස් වීම.

(3) ගෝලීය තොරතුරු අවකාශයට විවෘත වීම. (4) සංස්කෘතියට නොගැලපෙන විලාසිතාවලට යොමු වීම.

18. සඟරාවක ස්වභාවය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) පර්යේෂණාත්මක දත්ත හා තොරතුරු ඇතුළත් වූවකි.

(2) විවිධ තේමා ඔස්සේ වෙන් වෙන් වශයෙන් පළ කළ හැකිය.

(3) කාලීන හා උණුසුම් පුවත් අන්තර්ගත වේ.

(4) විවිධ අර්ථකථන හා මතවාදවලින් යුක්ත වූවකි.

19. ජනමාධ්‍ය හා රජය අතර පවතින සම්බන්ධතාවේ දී අවම මැදිහත්වීමක් ඇති කාර්යය වන්නේ,

(1) රජයේ සංවර්ධන සැලසුම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීම

(2) මහජන මතය රජයට හිතකර අයුරින් පවත්වා ගැනීමට සහාය වීම

(3) රජයේ දේශපාලන ප්‍රවෘත්ති මහජනයා තුළ තහවුරු කිරීම

(4) රජයේ සියලු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට සහය ලබා දීම

❖ **පහත ප්‍රවෘත්තිය ඇසුරින් 20 - 21 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

**"කොටහේන ප්‍රදේශයේ නීති විරෝධී ලෙස ජනප්‍රිය ගායකයෙකුගේ ගීත තැටිගත කර, අලෙවි කළ පුද්ගලයෙකු පොලිසිය විසින් අත්අඩංගුවට ගෙන නඩු පවරන ලදී."**

20. සංයුක්ත තැටි නීති විරෝධී නොවන ලෙස අලෙවි කිරීමට ආයතන හිමිකරුට ගත හැකිව තිබූ පියවරක් වන්නේ,
    (1) ගීත රචකයාගෙන් අවසර ලබා ගැනීම යි.
    (2) ගීතයේ ගායකයාගෙන් අවසර ලබා ගැනීම යි.
    (3) ගීතයේ සංගීත නිර්මාණ ශිල්පියාගෙන් අවසර ලබා ගැනිම යි.
    (4) ගීතයේ රචකයාගෙන් හා සංගීත නිර්මාණ ශිල්පියාගෙන් අවසර ලබා ගැනීම යි.

21. ඉහත සිදුවීමට අදාළව අත්අඩංගුවට ගත් ආයතනයේ හිමිකරු වැරදිකරු වුවහොත් ඔහුට ලබාදිය හැකි දඬුවමක්/දඬුවම් වනුයේ,
    (1) මාස තුනක් නොඉක්මවන සිර දඬුවමක් ලබා දීම
    (2) අදාළ ගීතයේ නිෂ්පාදන වියදම ගෙවීම හෝ මාස හයක සිර දඬුවමක් හෝ ඒ දෙකට ම යටත් කිරීම
    (3) රුපියල් පන්ලක්ෂය නොඉක්මවන දඩයකට යටත් කිරීම හෝ මාස අටක් නොඉක්මවන සිර දඬුවමකට යටත් කිරීම
    (4) මාස හයක් නොඉක්මවන සිර දඬුවම් ලබා දීම හෝ රුපියල් පන්ලක්ෂය නොඉක්ම වන දඩ මුදලක් හෝ එම දඬුවම් දෙක ම ලබා දීම

22. කටහඬ පමණක් භාවිත කරමින් සිදු කරන නිවේදන වර්ගය වන්නේ,
    (1) කිංකිණි නිවේදන (2) වෙළෙඳ නිවේදන
    (3) තොරතුරු නිවේදන (4) අවධාරිත නිවේදන

23. විද්‍යුත් පුවත්පතක වාසියක් **නොවන්නේ,**
    (1) තොරතුරු වර්ගකර පළ කොට තිබීම (2) නිරන්තරව යාවත්කාලීන කළ හැකි වීම
    (3) ගබඩා කර තබා ගැනීමේ අපහසුතාව (4) වැඩි පාඨක පිරිසක් අතර පුවත්පත සංසරණය වීම

24. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් මානව හිමිකම් හා වගකීම් පිළිබඳ **අසත්‍ය** ප්‍රකාශය වන්නේ,
    A. සහජීවනයෙන් යුතුව සමාජ ජීවිතය ගත කිරීමට ඇති මානව අයිතිය සුරැකීම මෙමගින් සිදු වේ.
    B. පුද්ගලයෙකුගේ පැවැත්ම තහවුරු කරන සමාජමය ආරක්ෂණ පද්ධතියක් ලෙස ක්‍රියාත්මක වේ.
    C. තම පෞද්ගලිකත්වය පමණක් ආරක්ෂා කරගනිමින් ජීවත්වීමට පෙළඹවීම සිදු කරයි.
    D. යම් සමාජයක් තුළ මානව හිමිකම් සුරැකීමේ වගකීම පැවරෙන්නේ රජයට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පමණි.
    (1) A හා D ය. (2) B හා D ය. (3) C හා D ය. (4) A හා C ය.

25. මුලුතැන්ගෙයි සිට පිටි කළ පොල්කිරි යොදා ආහාර පිසින කාන්තාවක් රූපවාහිනියේ නිතර පෙන්වනු දුටු අදීෂ, "අම්මේ ඇයි ඒ ගෙදර අම්මා විතරක් තනියම කුස්සියේ. අපේ තාත්තාත් සමහරදාට උයනවානේ'' යනුවෙන් පැවසීය. අදීෂගේ හැඟීම සමාජයීය නියෝජන අධ්‍යයනය තුළින් විග්‍රහ කළ හැකි වන්නේ,
    (1) වාර්ගිකත්වය පිළිබඳ සංකල්පය ලෙස ය. (2) මානව හිමිකම් හා වගකීම් ලෙස ය.
    (3) පවුල නැමැති සංකල්පය ලෙස ය. (4) ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංකල්පය ලෙස ය.

26. පහත A, B, C, D වගන්ති මගින් දැක්වෙන කරුණුවලට අදාළ නිවැරදි වරණය වන්නේ,

A සමාජයට අනුගත වීමේ ක්‍රියාවලිය

B පංචේන්ද්‍රියයෙන් ග්‍රහණය වන සන්දේශ තේරුම් ගැනීම

C හැඟීම්, සිතුවිලි හා අදහස් අන්‍යයන් සමඟ හුවමාරු කිරීම

D සන්නිවේදකයාගේ සිට ග්‍රාහකයා වෙත යන සන්දේශ පාලනය

(1) සමාජානුයෝජනය, සංජානනය, සන්නිවේදනය, දොරටුපාල ක්‍රියාවලිය
(2) සංජානනය, සමාජානුයෝජනය, සන්නිවේදනය, දොරටුපාල ක්‍රියාවලිය
(3) සමාජානුයෝජනය, සන්නිවේදනය, සංජානනය, දොරටුපාල ක්‍රියාවලිය
(4) දොරටුපාල ක්‍රියාවලිය, සංජානනය, සමාජානුයෝජනය, සන්නිවේදනය

27. ගුවන්විදුලි පිටපත් රචකයෙකුට විෂය දැනුමට අමතරව,
(1) දිගු කාලීන අභ්‍යාස අත්‍යවශ්‍ය වේ.
(2) විශේෂාංග රචනය පිළිබඳ පළපුරුද්ද අත්‍යවශ්‍ය වේ.
(3) වැඩසටහන් ආකෘති පිළිබඳ වැටහීම අත්‍යවශ්‍ය නොවේ.
(4) ඉදිරිපත් කරන ගුවන් කාලය පිළිබඳ වගකීම අත්‍යවශ්‍ය නොවේ.

28. සංඛ්‍යාංක ඡායාරූපයක වර්ග අඟලක් තුළ පවතින පික්සල් (Pixel) සංඛ්‍යාව යනු ඡායාරූපයේ,
(1) ස්වර්ණමය රීතිය යි.
(2) විභේදන බලය යි.
(3) රූප සංරචනය යි.
(4) ක්ෂේත්‍ර ගැඹුර යි.

29. තොරතුරු රැස් කිරීම සඳහා භාවිත කළ හැකි නිරීක්ෂණ ක්‍රමයකි.
(1) ඍජු නිරීක්ෂණය
(2) වක්‍ර නිරීක්ෂණය
(3) මනා නිරීක්ෂණය
(4) සියුම් නිරීක්ෂණය

30. පුවත්පතක අන්තර්ගතය,
(1) කාලානුරූපීව වෙනස් නොවන්නකි.
(2) මුද්‍රණ ශිල්පීය විවිධතාවලින් යුක්ත නොවන්නකි.
(3) නිර්මාණශීලී ආකෘති භාවිත වන්නකි.
(4) පෙළ හා රූපයේ නොගැළපීම මත පවතින්නකි.

31. A ඍජු වාර්තාකරණය

B නිර්මාණාත්මක වාර්තාකරණය

C සම්මුඛ සාකච්ඡා

D ආයතනික මූලාශ්‍ර

තොරතුරු වාර්තාකරණය සම්බන්ධ ඉහත අංගවලට අදාළ කරුණු අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ප්‍රවෘත්ති රචනය, විශේෂාංග රචනය, තොරතුරු මූලාශ්‍ර, තොරතුරු රැස්කරන ක්‍රම
(2) විශේෂාංග රචනය, ප්‍රවෘත්ති රචනය, තොරතුරු මූලාශ්‍ර, තොරතුරු රැස්කරන ක්‍රම
(3) ප්‍රවෘත්ති රචනය, විශේෂාංග රචනය, තොරතුරු රැස්කරන ක්‍රම, තොරතුරු මූලාශ්‍ර
(4) විශේෂාංග රචනය, ප්‍රවෘත්ති රචනය, තොරතුරු රැස්කරන ක්‍රම, තොරතුරු මූලාශ්‍ර

32. යම් විද්‍යාත්මක, සාහිත්‍යමය හෝ කලාත්මක නිෂ්පාදනයක කර්තෘ යම් අයෙක් වේද, එම තැනැත්තාට තම ස්වතන්ත්‍ර නිර්මාණයේ සදාචාරාත්මක හා ද්‍රව්‍යාත්මක අයිතිය ආරක්ෂාකර ගැනීමට අයිතිය ඇත්තේ ය. මෙම ප්‍රකාශය

(1) 1948 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රකාශනයේ දැක්වෙන්නකි.

(2) 1979 අංක 52 දරණ බුද්ධිමය දේපළ පනතේ දැක්වෙන්නකි.

(3) 1958 ශ්‍රී ලංකා මානව හිමිකම් ප්‍රකාශනයේ දැක්වෙන්නකි.

(4) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ 19 වන වගන්තියේ දැක්වෙන්නකි.

33. යම් මූලාශ්‍රයකින් ලබා ගන්නා තොරතුරු සිතාමතා විකෘති කිරීමෙන් පුද්ගලයෙකු උත්සාහ දරන්නේ,

(1) තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම ය. (2) පුද්ගල අනන්‍යතා හෙළි නොකිරීම ය.

(3) තොරතුරු මූලාශ්‍ර සඟවා තබා ගැනීමට ය. (4) තම වාසියකට හෝ අවශ්‍යතාවකට යොදා ගැනීම ය.

34. මානව සන්නිවේදනයට සාපේක්ෂව සත්ත්ව සන්නිවේදනය,

(1) සංකීර්ණ හෝ නිර්මාණශීලී හෝ නොවේ. (2) ඉතාමත් නිර්මාණශීලී වේ.

(3) සංකීර්ණ හා විවිධ වේ. (4) අවස්ථාව හා පරිසරය අනුව වෙනස් වේ.

35. රූපවාහිනී වෙළෙඳ දැන්වීමකින් වෙළෙඳ ආයතනයක් බලාපොරොත්තු වන්නේ,

(1) රූපවාහිනී ආයතනයේ ජනප්‍රියතාව වර්ධනය කිරීම ය.

(2) භාණ්ඩයක් හෝ සේවාවක් හඳුන්වා දීම හා අලෙවිය වැඩිකර ගැනීම ය.

(3) යම් සේවාවක් සඳහා අලෙවි සන්නාමකයින් පත්කර ගැනීම ය.

(4) යම් භාණ්ඩයක් නිෂ්පාදනය කරන අයුරු ජනතාවට දැනුවත් කිරීම ය.

36. මාධ්‍ය ක්‍රියාකාරීත්වය කෙරෙහි රජයෙන් සිදු කරන වක්‍ර මැදිහත් වීමකි,

(1) හදිසි අවස්ථාවල දී සන්දේශ පාලනය කිරීම යි

(2) විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මඟින් බලපත්‍ර ලබා දීම

(3) රාජ්‍ය මාධ්‍ය ආයතනවලට මාධ්‍යවේදීන් පත් කිරීම

(4) මාධ්‍යවේදීන්ට විවිධ පහසුකම් හා වරප්‍රසාද ලබා දීම

37. මාධ්‍ය විචාරකයා යනු,

(1) සන්දේශ පිළිබඳ දැඩි විවේචන එල්ල කරන්නෙකි.

(2) නිර්මාණකරුවා පිළිබඳ ඇගයීම් කරන්නෙකි.

(3) මාධ්‍ය හා ග්‍රාහකයා අතර සම්බන්ධය ශක්තිමත් කරන්නෙකි.

(4) සන්දේශයේ දෝෂ පිළිබඳ අදහස් ඉදිරිපත් කරන්නෙකි.

38. මාධ්‍ය පවත්වාගෙන යාම සිදු කෙරෙන ප්‍රධාන අරමුණු දෙක වන්නේ,

(1) පෞද්ගලික සේවාවක් ලෙස හා වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යාම යි.

(2) මහජන සේවාවක් ලෙස හා වාණිජ පරමාර්ථයෙන් පවත්වාගෙන යාම යි.

(3) මහජන සේවාවක් ලෙස හා බහු ජාතික පරමාර්ථයෙන් පවත්වාගෙන යාම යි.

(4) පොදු සේවාවක් ලෙස හා පෞද්ගලික පරමාර්ථයෙන් පවත්වාගෙන යාම යි.

39. රූපවාහිනියේ විකාශය වන ටෙලි නාට්‍යයක් දෙස බලා සිටි විමල් එහි භාවිත වන ග්‍රාම්‍ය භාෂාව පිළිබඳ අප්‍රසාදය ආයතනය වෙත දන්වා යැවිය යුතු යැයි සිතී ය. ඔහු,

(1) නිශ්ක්‍රීය ග්‍රාහකයෙකි. (2) සක්‍රීය ග්‍රාහකයෙකි.

(3) ක්‍රියාශීලී ග්‍රාහකයෙකි. (4) පොදු ග්‍රාහකයෙකි.

40. ප්‍රකාශනයක මුද්‍රණය වන කොටසේ දිග පළල, පිටු අංක කිරීම, පටුන සම්පාදනය හා පිටකවරය සැකසීම යන කාර්යයන් අදාළ වන්නේ,

(1) ප්‍රකාශනයේ අත්පිටපත සැකසීමට ය. (2) මුද්‍රණය හා පිටපත්කරණයට ය.

(3) ප්‍රකාශනයේ නිමි කටයුතු වලට ය. (4) අකුරු යෝජනය හා පිටු සැලසුම් කිරීමට ය.

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 87 | S | II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - උපකාරක සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
கல்விப் பொதுத் தராதரப் பத்திர )சாதாரண தர(ப் பரீட்சை- ஆதரவு கருத்தரங்கு தொடர் - 2022 (2023)
**G. C. E. Ordinary Level Examination - Support Seminar Series - 2022 (2023)**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I,II**
**தொடர்பாடலும் ஊடகக் கல்வியும் I,II**
**Communication and Media Studies I,II**

**සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II**

* **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක් ද** ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
* **පළමුවැනි** ප්‍රශ්නයට ලකුණු 20ක් හිමිවන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් හිමි වේ.

1. අඛණ්ඩව දින ගණනාවක් පැවති වායු ගෝලීය දූෂණය පිළිබඳ රූපවාහිනී නාලිකාවක් තුළින් සාකච්ඡාමය වැඩසටහනක් විකාශය විය.

(i) රූපවාහිනී සාකච්ඡාමය වැඩසටහනක් මගින් ඉටුකරගත හැකි සන්නිවේදන අරමුණු **දෙකක්** ලියන්න.

(ii) ශ්‍රී ලංකාවේ ප්‍රථම රූපවාහිනී නාලිකාව හා එහි ආරම්භක වර්ෂය කුමක් ද?

(iii) රූපවාහිනී මාධ්‍ය අයත්වන සන්නිවේදන වර්ගය හා ස්වරූපය දක්වන්න.

(iv) රූපවාහිනී මාධ්‍ය සඳහා තොරතුරු රැස් කරන්නෙකු ලෙස කටයුතු කිරීමේ දී ඔබ සතු විය යුතු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(v) රූපවාහිනී මාධ්‍යයේ වැඩසටහන් ප්‍රභේද **දෙකක්** නම් කරන්න.

(vi) රූපවාහිනී වැඩසටහන් මගින් පුද්ගල යහපතට හේතුවන බලපෑමක් සහ අයහපතට හේතුවන බලපෑමක් ලියන්න.

(vii) රූපවාහිනී මාධ්‍යයේ නව ප්‍රවණතා **දෙකක්** නම් කරන්න.

(viii) අඩු කාල පරතරයක් සහිතව රූප පෙළක් චලනය වීමෙන් රූප අතර පරතරය ඇසට හසු නොවීම පැහැදිලි කරන සිද්ධාන්තය කුමක් ද?

(ix) නිශ්චල ඡායාරූප පෙළක් චලනය කිරීමෙන් දර්ශනයක් ඉදිරිපත් කිරීමට මුල් යුගයේ යොදාගත් උපකරණය කුමක් ද?

(x) සිනමා කර්මාන්තයේ මුල් යුගය හැඳින්වූයේ කුමන නමකින් ද? එම යුගයේ ප්‍රබල සිනමාකරු කවුරුන් ද?

2. අ.පො.ස (සා/පෙළ) විභාගය ඉලක්ක කර ගනිමින් පැවති සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය විෂය සම්මන්ත්‍රණයේ දී සිසුන් තුළ මතුවූ ගැටලු සාකච්ඡා කර ගැනීමට ඔවුහු Zoom තාක්ෂණයෙන් හමුවක් (Meeting) යොදාගත්හ.

(i) Zoom තාක්ෂණයෙන් ඉහත හමුව පැවැත්වීමට අදාළවන සන්නිවේදන වර්ගය කුමක් ද?
(ii) එම සන්නිවේදන වර්ගයේ ලක්ෂණ **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) සම්මන්ත්‍රණය සඳහා භාවිත කළ හැකි ප්‍රක්ෂේපණීය සන්නිවේදන උපකරණ **තුනක** ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.
(iv) විෂය ගැටලු නිරාකරණය කර ගැනීමට ගුරුවරයා ලබා දෙන සටහනක් හුවමාරු කරගත හැකි නව මාධ්‍ය විධික්‍රම **හතරක්** පිළිබඳ විස්තර කරන්න.

3. ශ්‍රවණ නිපුණතා සංවර්ධනය කර ගැනීමටත් පරිකල්පනීය ශක්තිය වර්ධනය කර ගැනීමටත් ගුවන්විදුලියට සවන් දීමෙන් හැකියාව ලැබේ.

(i) ගුවන්විදුලි සංඥා සම්ප්‍රේෂණය සඳහා භාවිත කරන තරංග වර්ග **දෙකක්** නම් කරන්න.
(ii) ගුවන්විදුලි මාධ්‍යයේ ලක්ෂණ **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) සාම්ප්‍රදායික ශ්‍රව්‍ය මාධ්‍ය **තුනක්** පැහැදිලි කරන්න.
(iv) ගුවන්විදුලි මාධ්‍යයේ ප්‍රබලතා දෙකක් සහ දුබලතා **දෙකක්** විස්තර කරන්න.

4. නිර්මාණාත්මක ක්‍රමවේද භාවිතයෙන් සංකීර්ණ අදහසක් වුව ද ඉතා ආකර්ෂණීය හා සරල ලෙස ඉදිරිපත් කළ හැකි ය.

(i) නිර්මාණයක් යනු කුමක් ද?
(ii) බුද්ධිමය දේපළ සම්බන්ධ අයිතිවාසිකම් **දෙවර්ගය** කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) මාධ්‍ය සන්දේශයකින් ඉදිරිපත් වන අදහස කුමක්දැයි තීරණය කිරීමට හේතුවන සාධක **තුනක්** විස්තර කරන්න.
(iv) මාධ්‍ය මගින් ඉදිරිපත් කරන ප්‍රචණ්ඩකාරී සිදුවීම්වලට නිරන්තරයෙන් මුහුණ දීමෙන් ළමුන්ට සිදුවිය හැකි අයහපත් බලපෑම් නිදසුන් **හතරකින්** විස්තර කරන්න.

5. අන්තර්ජාලය භාවිතයට පැමිණීමත් සමඟ සියලු මාධ්‍ය එක්ව පරිහරණය කිරීමට හැකියාව ලැබී ඇත.

(i) මෙම ක්‍රියාකාරීත්වය පැහැදිලි කිරීමට සන්නිවේදන ක්ෂේත්‍රයේ භාවිත වන සංකල්පය කුමක් ද?
(ii) ජන මාධ්‍ය බෙදා දැක්විය හැකි ප්‍රධාන කොටස් **දෙක** නිදසුන් සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.
(iii) මාධ්‍යවේදියෙකුට තමා සකස් කළ සන්දේශ ජන මාධ්‍ය ආයතනය වෙත ඉක්මණින් සහ ආරක්ෂිතව යැවීමට භාවිත කළ හැකි නව මාධ්‍ය විධික්‍රම **තුනක්** පැහැදිලි කරන්න.
(iv) අන්තර්ජාලයෙන් පුවත්පත පරිහරණය කිරීමේ වාසි **හතරක්** විස්තර කරන්න.

6. සඳුන් සහ නිමේෂ් පසුගිය සතියේ සහභාගී වූ 11 ශ්‍රේණියේ වාර්ෂික අධ්‍යාපන චාරිකාව පිළිබඳ පාසල් විවේක කාලයේ දී සාකච්ඡා කරමින් සිටියහ.

(i) එම අවස්ථාවේ දක්නට ලැබෙන ප්‍රධාන සන්නිවේදන ස්වරූපය හා සන්නිවේදන වර්ගය දක්වන්න.

(ii) ඔබ සඳහන් කළ සන්නිවේදන වර්ගයේ ලක්ෂණ **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) පුද්ගලයා තුළ ම සිදුවන සන්නිවේදනය නම් කර එහි විශේෂතා **දෙකක්** පැහැදිලි කරන්න.

(iv) සාමාන්‍ය ජීවිතයේ දී ද්වි පුද්ගල සන්නිවේදනය හඳුනාගත හැකි අවස්ථා **හතරක්** පිළිබඳව විස්තර කරන්න.

7. ශ්‍රී ලංකාවේ ජන මාධ්‍ය ඉතිහාසය සම්බන්ධයෙන් පහත කාරණාවලට පිළිතුරු සපයන්න.

(i) අ) ශ්‍රී ලංකාවේ ප්‍රථම පුවත්පත
ආ) ශ්‍රී ලංකාවේ ප්‍රථම සිංහල පුවත්පත
ඇ) ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ ප්‍රථම සිංහල පුවත්පත
ඈ) ශ්‍රී ලංකාවේ ප්‍රථම පෞද්ගලික පුවත්පත් ආයතනය

(ii) සංවිධානයක් තුළ විධිමත් සන්නිවේදනය ක්‍රියාත්මක වන ආකාර **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) සමාජ මාධ්‍ය පරිහරණයේ දී සැළකිලිමත් විය යුතු ආචාරධර්ම **තුනක්** විස්තර කරන්න.

(iv) ගුවන්විදුලි මාධ්‍ය සඳහා පිටපත් රචනයේ දී සැළකිලිමත් විය යුතු කරුණු **හතරක්** පැහැදිලි කරන්න.

*****